# රත්නදීප

December 2011

## RATHNADEEPA NEWS LETTER

**UNITED SRILANKA ASSOCIATION (AUCKLAND BRANCH) INC.**

## කිතු උපත සහ නව අවුරුදු උදාව සමරමු



**ඔබ සැමට සාමය සතුට පිරි සුබ නත්තලක් සහ ලබන්නාවූ නව වසර ප්‍රිතියෙන් සතුටෙන් සැපතෙන් පිරි වසරක් වේවා, පතන්නේ එක්සත් ශ්‍රිලංකා සංවිධානයේ ඕක්ලන්ත ශාඛාවේ සභාපතිතුමා, කාරකසභිකයන් ඇතුලු සියලු සාමාජිකසාමාජිකාවන් විසිනි.**

**Wish you a Merry X’mas and a Happy New Year From President and the members of USLA Auckland branch**

**USLA**

**Patron**
Dr. Gamini Ediriweera
Tel: (09)522 8530

**President**
Susantha Nawaratne
Tel: (09) 835 0569

**Vice-President**
Don Hettiarachchi
Tel:(09) 828 3316

**Secretary**
Chinthaka Edirisuriya
Tel:(09)529 4461

**Assistant Secretary**
Sunethra Abhyawardena
Tel:(09) 813 3754

**Treasurer**
Rasika Gallage
Tel: (09) 522 4444

**Editor**
Sunil Ratnayake
Tel:(09) 6305705

**Committee Members**
N.W. Dayaratne
Tel: (09) 8280185
G.S. Perera
Tel: (09) 576 5599
Rukmal Ediriweera
Tel: (09) 522 8530
Leslie Jayathilake
Tel: (09) 379 2244
Leslie Pieris
Tel: (09) 948 2478

Postal Address
'RATHNADEEPA'
United Sri Lanka
Association
PO Box 74-136
Great South Road
Greenlane West
Auckland
New Zealand

Website: www.usla.co.nz

# නවසිලන්ත ශ්‍රීලංකාරාමයේ අධිපති පූජ්‍ය වල්ගම ශ්‍රී මුනින්ද්‍රවංශ නාහිමි සමග පිලිසඳරක්



මම ඉපදුනේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන වල්ගම,උපන් දිනය 1947 පෙබරවාරි මාසයේ 20. මගේ අප්පච්චි හේරත් මුදියන්සේලාගේ රන්හාමි, මගේ අම්මා හේරත් මුදියන්සේලාගේ රන්මැණිකේ. අපේ පවුලේ සහෝදරයන් හතරදෙනයි, සහෝදරියන් පස්දෙනයි, මම පවුලේ හයවෙනියා. මම ගිහිකාලයේ මුලින්ම වල්ගම ප්‍රාථමික විද්‍යාලයෙත් ඊට පස්සේ උඩගලදෙනිය වලගම්බාහු මහා විද්‍යාලයෙත් අධ්‍යාපනය ලැබුවා. කුඩාකාලයේ සිටම මහණ වීමට පැවති ආශාව නිසා 1961 දි මහණ වුනා. මට ගුරු හාමුදුරුවරුන් දෙනමක් ඉන්නවා. ඒ උඩගලදෙනිය දවුලු රජමහා විහාරාධිපති වැවතැන්නේ පියතිස්ස නාහිමි සහ පානකාවේ ධම්මපාල නාහිමියන්.

මම පැවිදි අධ්‍යාපනය ආරම්භ කලේ කෑගල්ලේ ශ්‍රී විශුද්ධාරාම පිරිවෙනේ, එතන සාමාන්‍ය පෙල දක්වා අධ්‍යාපනය ලැබුවා. උසස් පෙල අධ්‍යාපනය ලැබුවේ නුගේගොඩ පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙනේ. විද්‍යොදය විශ්වවිද්‍යාලයෙන් ( ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය ) (1973-1976 ) උපාධිය ලැබුවා සිංහල,පාලි, බුද්ධ ධර්මය විෂයන් වලට. මගේ මුල්ම ගුරු පත්වීම ලැබුනේ 1976 දි ගලේවෙල මහා විද්‍යාලයට, ඉන්පසු 1978 දි පමන රඹුක්කන දැලිවල මහා විද්‍යාලයට මාරුවීමක් ලැබුනා. 1988සිට 2002 දක්වා එම පාසලේ විදුහල්පති ලෙස වැඩ කළා. එම කාලයේදි පාසලේ දියුණුවට විශාල සේවයක් කරා.

මගේ ශිෂ්‍යයෙකු මෙන්ම ලෝක තරුණ භික්ෂු සංවිධානයේ ලේකම් වන මුගුණුවෙල අනුරුද්ධ හිමියන් විසින් 1999 මැයි මස ශ්‍රීලංකාරාමය ආරම්භ කල අතර ඊට පෙර මගෙන් කැමත්ත ගත්තා, අනාගතයේ දවසක ශ්‍රීලංකාරාමයේ අධිපතිකම භාරගන්නා බවට. ඒ අනුව මම 2002 වසරේ සිට ශ්‍රීලංකාරාමයේ අධිපතිකම භාර ගත්තා. රඹුක්කන වල්ගම පුරාණ විහාරයේ සහ උඩගලදෙනිය දවුල්ල රජමහා විහාරයේත් අධිපති මමයි.අස්ගිරි විහාර පාර්ශවයේ මහානාහිමියන් විසින් මාව පසුකලෙක නවසිලන්තයේ ප්‍රධාන සංඝනායක ලෙස පත්කරා. මම ලංකාවේ සතර කෝරළ මහ දිශාවේ ප්‍රධාන අධිකරණ සංඝනායකමත් දරනවා.

මගේ සමාජ සේවා කටයුතු ගැන කියනවා නම්, රඹුක්කන සාසනාරක්ෂක බලමණ්ඩලයේ ලෙකම් ලෙස අවුරුදු 23 නිතරගයෙන් පත් වෙමින් සේවය කළා එම බලමණ්ඩලයෙන් දහම් පාසල් හයසියයක් පමන පාලනය කරනවා. 1978 සණස පිහිටුවීමේදි ආරම්භක සාමාජිකයෙකු ලෙස කටයුතු කළා. වයඹ පලාතේ වැව් පිලිසකර කිරිම සඳහා විශාල සේවයක් කල ජාතික උරුමය නම් වු සංවිධානය උපාලි සේනානායක (ආර්. පි. සේනානායක මහතාගේ මල්ලි ) මහතාගේ සභාපතිත්වයෙන් ආරම්භ කිරිමට මුල්වුනා.එම කාලයේදි සර්වෝදය සංවිධානයේ විවිධ තනතුරු දරමින් සේවය කළා. වර්තමානයේ මේ රටේ සිටින සියලු බෞද්ධ ජනතාවට ආගමානුකුලව සෙත සලසමින් මේ රටේ බුදුදහම පැතිරවීමට කටයුතු කරමින් සිටිනවා.

සාකච්චා කලේ, සුනිල් රත්නායක

## එළාර කවුද?

ඔන්න හැමෝම අහල තියෙනවනෙ ඉතින් එළාර දුටුගැමුණු යුද්දේ ගැන. ඒක ගැන තමයි මම අද කට කහන කතාව ලියන්න හිතුවෙ. ඇත්තම කියනවා නම් දුටුගැමුණු ගැන නෙවෙයි එළාර ගැන තමයි ලියන්න යන්නේ. මම ටික කාලෙකට ඉස්සර, ඒ කියන්නේ දැනට අවුරුදු 10 කට එහා පැත්තේ මොකක්දෝ පත්තරයක් කියව කියව ඉන්නකොට කවුදෝ මහත්තයෙක් එළාර දෙමළෙක්ද ප්‍රශ්නය අහල තිබුනා පත්තරේකින් මතකයි. හැබැයි මට හරියටම මතක නැහැ ලිපිය මොකක් සම්භන්ධයෙන්ද කියලවත්, කවුද ලිව්වෙ කියලවත්. හැබැයි බොලේ මටත් තේරුනා ඒ ප්‍රශ්නයේ තිබුනු සාධාරණත්වය. හැබෑටම අපේ රටේ මෙච්චර දෙමළ ජාතිකයෝ පිරිසක් ජීවත් වෙනවා, අපිට මෙච්චර කාලයකට හම්බවෙලා තියෙනවද එකම එක දෙමළ ජාතිකයෙක් හරි එළාර කියල නම තියෙන?

කහන කතාවක් තියෙනව, ඒක ඉතින් ගම මේ වැඩ කරන ඩුබායි පුරවරයේ ඉන්දියාවේ හැම පළාතකින්ම වගේ ඇවිත් වැඩ කරන ඉන්දියානුවෝ තොගයක් ඉන්නවනෙ, ඇත්තටම කියුවොත් මෙහේ ජනගහනයෙන් 80% ක් විතර ඉන්නේ ඉන්දියාවෙන් ආපු කට්ටිය තමයි. (මේක සම්බන්ධයෙනුත් ඔය පොඩි කට පස්සේ ලියන්න බැරියෑ.)

ඉතින් ඔය අතරෙ මලයාලි, කර්ණාටක,චෙන්නායි, මේකී නොකී දකුණු ඉන්දියානුවෝ ගොඩක් එක්ක මම වැඩ කරල තියෙනව. හැබැයි මෙච්චර කාලෙකට මට එකම එකෙක්වත් හම්බ වුනේ නැහැ ඔය එළාර නම තියෙන. ඒක වෙන්න පුලුවන්ද?එළාර දෙමළෙක් හරි, ආවෙ ඉන්දියාවෙන් නම් හරි, අඩු ගානේ සීයක් හමාරක්වත් ඉන්න එපාය ඔය නම තියෙන,බොරුද මම කියන්නේ. ඔය ඉන්දියාවේ බොලිවුඩ් නලුවෝ නිලියෝ ඇතිකරන බල්ලගෙ නමත් තමන්ගෙ අලුතෙන් ඉපදුන දරුවට දාන රටේ මේක විශ්වාස කරන්න පුලුවන්ද හැබෑට? මෙච්චර මේ බලගතුව හිටිය රජ කෙනෙක්, ඊටත් වැඩිය ලංකාව ආක්‍රමණය කරල අවුරුදු බර ගානක් පාලනය කරපු රජ කෙනෙක්ගෙ නමක් තියෙන වෙන එකෙක්වත් නැති එක?

මම ඉතින් ඕක කල්පනා කලා, මොකක්ද හැබැටම වෙන්න ඇත්තෙ කියලා.මම ඉතින් දවසක් රාත්තිරි ඕක කල්පනා කර කර ඉඳලා යන්තං ඇහැ පියවුනා විතරයි, හොල්මනක්ද පොල්කොළ මේන්න එනවා, කවුද? එළාර. මහා සද්දන්ත දේහයක් තියෙන කට්ට කලු පොරක්.සුදු පාටට හුරු ඇඳුමක්ද කොහෙද තමා ඇඳගෙන හිටියෙ. මම හිතන්නෙ එයාව ආදාහනය කරන වෙලාවෙ අන්දල තිබුන විදියටම තමයි ඇවිල්ලා තිබුනෙ.දුටුගැමුණු රජ්ජුරුවෝ ගහපු හෙල්ල පාරත් තාම පපුව හරියෙ පේන්න තියෙනවා. පොර ඇවිත් ඉතින් මට කතා කරා. දූමි..දූමි..මම එළාර..!

අප්පට සිරි ගජ, මගෙ කකුල් දෙකත් මැඩිලින් ගහනව ගහනව වගේ.අනික පොර මගෙ මගෙ නම දන්නෙ කොහොමද? ඕකත් හිතන්න දෙයක්ද, මේ ලෝකේ ඉන්නකොට අප ඔය ලෝකේ වෙන ඔක්කොම දන්නවා. ඉතින් ඔහේගෙ නම හොයාගන්න එකත් කජ්ජක්ද? එළාර අහපි. ඒ කියන්නෙ මම හිතනදේත් පොරගෙ රේඩාර් එකට වදිනවා. අනික පොර කතාකරන්නෙ හොඳ පැහැදිලි සිංහලෙන්, දෙමළ ඇක්සන්ට් එකක් ගෑවිලාවත් නැහැ.ඒ කියන්නෙ දැන් මගෙ ඉස්සරහ මේ ඉන්නේ එළාර, දුටුගැමුණු රජතුමත් එක්ක යුද්ධ කරල පැරදිච්ච එළාර. කොහොමෙන් කොහොම වුනත් දුටුගැමුණු රජතුමාත් එළාරට ගරු බුහුමන් දැක්වුවා කියලත් කියනවනෙ. ඉතින් මම මොකෙක්ද, මමත් ඉතින් කොච්චර බයවෙලා හිටියත් පුරුෂ ධෛර්‍යය ටිකක් එකතු කරගෙන ගරුසරු දක්වල කතාකලා. ඉතින් ඔබතුමා මොකද මේ පැත්තේ? මම ඇහුවා. ඔන්න එතකොට එළාර මගේ පැත්තකින් වාඩිවුනා, වාඩිවෙලා උගුරේ රැල්බුරුල් එහෙම ටිකක් බුරුල් කරගෙන ආයෙමත් කතාකරන්න පටන් ගත්තා. දූමි, මම දැන් දවස් කීපයක ඉඳන් දැක්කා දූමි කෙස් කරකව කරකව මගෙ මේ නම ගැන කල්පනා කරනවා. මෙච්චර කාලෙකට ඔය ප්‍රශ්නය ගැන මෙච්චර කල්පනා කලේ දූමී විතරයි. මගේ කරුමෙට ඔය ලංකාවෙ ඉතිහාසය ලියපු ඇයොත් මම ආවෙ ඉන්දියාවෙ චෝල රාජ්‍යයෙන් කියල මහම මහ පට්ටපල් බොරුවක්නෙ ලියල තියෙන්නෙ. එතකොට ඔබතුමා ලංකාවට ආවෙ ඉන්දියාවෙ ඉඳල නෙවෙයිද? මම ඇහුවා. මොන කෙහෙම්මල්ද? එළාර අහපි.එහෙනං ඔබතුමා කොහෙං ඇවිල්ලද ලංකාව ආක්‍රමණය කලේ? මම මගේ කට කහ කහ තිබුනු ප්‍රශ්නය දමල ඇරිය.

එතකොට එළාර මගේ දිහා මහා ගැඹුරු බැල්මක් දාලා ආයෙමත් උගුරේ රැල් බුරුල් කලා. ඊට පස්සෙ තව ටිකක් මගේ ළඟට කිට්ටු වෙලා මුන මට ලංකරල රහසින් වගේ කිව්වා, මම ආවේ වෙස්ට් ඉන්ඩීස් වල ඉඳන්. මම ජිවිතේටම බලාපොරොත්තු උන්නැති ඒ උත්තරෙන් මම හිටිතැනම එහෙම්මම නැගිට්ටුනා. මොකක්? වෙස්ට් ඉන්ඩීස් වල ඉඳන්! එතකොට එළාර ඔහුගෙ සීතල අතෙන් අල්ලලා මාව ආයෙමත් වාඩි කෙරෙව්වා. ඊට පස්සෙ හෙම්හිට පොර මෙච්චර වෙලාවක් දාගෙන හිටපු රත්තරන් පාට ඔටුන්න ගලෝල මට ඔලුව පෙන්නුව. කොණ්ඩෙ හොඳටම සුදු පාට වෙලා තිබුනත් ඒක හරියට අර කිව්වත් වගේ අප්‍රිකානුවෙක්ගෙ බොකුටු බොකුටු කොණ්ඩයක්ම තමා.එහෙනං කොහොමද ලංකාවෙ ඉතිහාසේ පොත්වල ඔබතුමා ඉන්දියාවෙන් ආව කියල ලියවුනේ? මම ඇහුව.

ඕකම නේන්නං දූමී මටත් තියෙන ප්‍රශ්නය, ඔක ලියවිලා තියෙන්නෙ හරිම වැරදි විදියටනෙ.එළාර ඉණට අත් දෙක තියාගෙන නැගිට්ට ගමන් කිව්ව. ඒ කාලෙ ලංකාවෙ මිනිස්සු දැකල තිබුනේ ඉතින්

ඉන්දියාවෙන් ආපු ඇයො විතරනෙ. විශේෂයෙන් මගේ මේ හමත් කලුම කලු නිසා මාව දැක්ක ගමන් මේ මිනිස්සු හිතුවෙ මමත් ආවෙ ඔය දකුණු ඉන්දියාව පැත්තෙන් කියල. ඉතින් ඔබතුමාට තිබුනනේ ඒ මිනිස්සුන්ට පැහැදිලි කරල දෙන්න ඔබතුමා සැපැත් උනේ වෙස්ට් ඉන්ඩීස් වලින් කියල, මම කිව්වා.මොකද නැත්තෙ කොලුවො, මම කොච්චර නම් කිව්වද ඒ යක්කුන්ට මම බටහිර ඉන්දියානුවෙක් කියල.එහෙම කියන්න කියන්න උන් පිලිගත්තෙ මම ඉන්දියාවෙ බටහිර පැත්තෙ ඉඳන් ආව කියලනෙ.උන් ඔය ඉන්දියාව මිසක් වෙන ඉන්දියාවක් ගැන දැනගෙන හිටියෙ නෑනෙ ඒ කාලේ, එළාර කියපි.

හැබෑ නේන්නං, ඕක ඉතින් වරදින එක ආයෙ අහන්න දෙයක්යෑ.... මට ඉබේටම කියවුනා.එතකොට ඔබතුමාගේ නම ? එළාර කියන නම තියෙන ඇයො වෙස්ට් ඉන්ඩීස් වල ඉන්නවද, මම ඇහුවා.එතකොටම එළාරට බකස් ගාලා හිනාවක් ගියා. හෙහ් හහ් පොඩ්ඩක් හිතපන් කොලුවො කියල එළාර මගේ දිහා මහ නක්කල් හිනාවක් දාගෙන බලාගෙන ඉන්නවා. මම ඉතින් පුරුද්දට මගේ තව කෙස් ගස් දෙක තුනක් රවුං කරන්න ට්‍රයි එකක් දෙමින් විනාඩි කිපයක් කල්පනා කලා. ඒත් මීටර වෙන්නෙම නැහැ.

ඔන්න එතකොටම එළාර ආපහු මගේ ලගින් වාඩිවෙලා මගේ කරට අතක් දැම්මා. පුතා මගේ හරි නම. . . .ඒ.ලාරා. ඔය වෙස්ට් ඉන්ඩීස් වල ක්‍රිකට් ගහපු බ්.ලාරා ඒ කියන්නෙ බ්‍රයන් ලාරා පැවතෙන්නෙත් මගේ පරපුරෙන්ම තමයි, කියාගෙන මට අත වනාගෙනම ඒ.ලාරා නොපෙනී ගියා.මම උඩ ගිහිල්ල ඇහැරුන පාරටම ඇඳ විට්ටමේ ඔලුව වැදිල එහෙම්මම සිහි නැතිවුනා.

මිගාර වීරරත්න- හැමිල්ටන්

නත්තල් ගසේ පලබර වී අතු නැමිලා
සිත් සංතොසින් යන්විය හැක හිත බැදිලා
අත්කොට සැපත දෙවියනි ලොව දෙස බලලා
උත්තම දහම සිහිකර දෙයි සිත සදලා

සිව්දිග එකලුකල සිරියෙන් අග පැමින
දෙව්පිය තරිඳු පායා නිලඹර නැගින
පවිමල දූරුව සතුටෙහි පිංපල ලැබින
රැව්දෙව් සමගියෙන් සැනහෙයි සවන

යනමග සොඳුරුමල් දහසින් පියදේවා
මනහර දැහැමි සිතුවිල්ලෙන් සැනසේවා
දිනදින දියුණුවේ ඉහලට පැමිණේවා
ගුණබර නත්තලක් ඔබ හැමටම වේවා

වල්ගම ශ්‍රී මුනින්ද්‍රවංස නාහිමි



## Christmas 2011

## A Time to Welcome and a Season of opportunity

Going down memory lane, my wife and I remember very well when we would wait patiently until our children would go to sleep on Christmas Eve (back in Sri Lanka) before collecting and wrapping the Christmas presents purchased specially for them. Early next morning, how both of us gave away the presents to them and saw the surprise and thankfulness on their smiling faces, as they eagerly opened the presents and admired each one with great interest and satisfaction.

The reason for the season – then and now is because it reminds us of the greatest gift ever given to mankind – salvation through Jesus Christ. Just like many of the wonderful blessings God gives us, the Lord appeared in a surprising manner.

Who could have guessed that God the son would come down to planet earth, in the form of a baby born in a stable, that the King of Kings would set aside. His glory and enter the human world to redeem sinful man?

Now that the Christmas Season is upon us, many of us would soon be busier than ever before. Buying presents, new dresses, decorating Christmas trees and houses, attending parties, carols, parades, travelling etc. – no shortage of things to do.

To us Christians this season can be a great opportunity to receive the King of Kings in a more meaningful way than ever before.

The most merciful God – seeing the sinful nature of created human beings – decided to send down His only Son – our redeemer Jesus Christ – to show us the correct way to live and to compensate for our sins by dying on the Cross, thereby bringing us hope, peace and redemption.

For Christians, Christmas is not a “One – off” thing. It is the end of a four week “expecting “ period called the Season of Advent, in preparation for the coming of the Lord. They are expected to confess their sins, make reparation for them, and begin a new life awaiting the great day. On Christmas day, priority should be given to religious duties.

So, Christmas is very important to all. It is the beginning of a redemptive process for all humans. We should show compassion to all beings, extend a friendly welcoming hand to them, and try to live peacefully with all.

I end with this little poem by Helen Steiner Rice:

Our Father up in heaven
Hear this fervent Christmas prayer
May the people of all nations
Be united in thy care
For earths peace and man’s salvation
Can come only by Thy grace
And not through bombs and missiles
And our guest for outer space

In this beautiful Christmas Season may we appreciate the wonder and joy of finding JESUS.

Wishing you a blessed Christmas and a New Year filled with His Love!

Rodney Fernando - Mt. Albert

## පසු විපරමක්

බල තණ්හාව ඇත්තේ ඉණිමග අගය
ඒ තරමටම මිනිසා දහමින් හිගය
වැඩියෙන් බදාගන්නේ වැරදිම මගය
දෙදහස් එකොලහද වේගෙන් යන වගය

සමගියෙ අගය ගැන දෙසුවත් නැතුව නිමා
කුලමල භේද පටු අදහස් පෙරට දමා
එක් වෙනවා නොවේ වෙන්වෙන එකම තමා
හැදෙනව නම් තවම කාටත් නොමැත පමා

තනතුරු මත නැගෙන නැතිවම හිරිකිතය
දගලති මුල්තැනට ගන්නට තම මතය
ඇතමුන් දුවන්නේ ලොව වැනසෙන අතය
මනුදම ටිකෙන් ටික දැන්නම් වනගතය

ලොව වැනසෙන පුවත දෙදහස් දොලහේදී
තව නැත හදවතට වැඩි දෙනෙකුගේ වැදී
දුක තේරුම් නොගෙන ජනතාවගේ හුදී
නැති බැරි අයගෙ බත්පතටම කඩා වදී

තම දහමට අනුව කෝවිල පල්ලියට
යුතුකම් නොකර රිංගාගෙන ගුල්වලට
විපතක් වුනවිටදි දුව එයි පන්සලට
තව පිරිසක් සිටිති එකතුව පිල්වලට

වැඩ නැතිවුනත් තනතුරු ටික බඩේ බැඳ
දගලන පිරිස් මියයන්නට බලේ ඉඳ
නොසිතති හෙටක් නැතිවම අද මැරේවිද
මේ මිනිසුන්ගෙ කවදා ඇස් ඇරේවිද?

**මීගස්තැන්නේ රතනජෝති හිමි**

සිංහල භාෂා සහ ප්‍රසාංගික පාසල
සෑම මසකම පළවැනි සහ තුන්වෙනි සෙනසුරාදා සවස 2.30 සිට 4.00 දක්වා පැවැත්වේ.
විස්තර සඳහා විමසන්න ඃ
අජන්තා දයාරත්න මහත්මිය - 8280185
කාන්ති ගුණතිලක මහත්මිය - 4686152

## USLA කෝපි සැදෑව

සෑම මසකම පළවෙනි සෙනසුරාදා සවස 4.00 සිට පැවැත්වේ. එයට සහභාගි වන ලෙස අපි ඔබට ආරාධනා කරමු.

# Thara Devi



In the eastern seaboard of Sri Lanka there was a sleepy village between Trincomalee and Batticaloa. A farmer in those long gone days of 1820’s was preparing the field for maha season and was tilling the soil.His mamoty strikes something solid. He stoops down to examine closely and one of the most beautiful figurines in the world was uncovered. It was the statue of Thara devi, the compassionate female bodhisatva. This was a figure which rivals the nephertiti statue of Egypt or venus de milo for beauty. This statue was deemed to be beautiful enough to be aquired by none other than the then British governor sir Robert Brownrigg. The statue was taken away from Sri Lanka(Ceylon) when he sailed home after handing over the govenership to sir Edward barnes. Subsequently the statue gets donated to the British museum in 1830. Since then it had occupied a prominent place in British museum’s Ceylon (later Sri Lanka) collection. During the second world war when the museum artifacts were removed to wales for safe keeping this statue was described as one of the most valuble pieces of the British museum.

The casting period for the Thara devi has been determined to be between AD 700-750. Immediately preciding this time period was a very unstable time in the island Lanka. King Manvamva brought peace and stability. He and his 3 sons (V Aggabodhi, III Kassapa, I Mahinda) were favoring the dhamaruchi sect of abbayagiri vihara. This sect was championing Mahayana doctrine in the island.

Thara devi is supposed to be the wife of the bodhisatva Avalokitheshvara. Avalokitheshvara is a prominent bodhisatva figure in Mahayana doctrine. The rulers of the day were establishing numerous temples and cave viharas for the mahayanic dhammaruchi sect bikkhus. It is no wonder the worship of the bodhisatva Avalokitheshvara and his wife was prevelant in the island. This seems specially so in the eastern province. Buduruwagala near Buttala has images of Avalokitheshvara and Thara devi hewn off a rock face. The beautiful figurine under disscusion was also found in the eastern province.

The beautiful statue of Thara devi is 143 cm tall (nearly 5 feet). It has been cast in bronze. Unusually it is cast solid, differing from many other figurines having a clay core. The statue has been guilded after casting.







She wears a tall headdress. This would have been inlaid with precious stones, but they are missing. Somewhere down her checkered past some looter, possibly an English one would have removed them and sold them separately. The large central cavity of the headrest would have once contained a seated image of Maithriya bodhisatva as was the common practice of all bodhisatva figures.

The statue is naked to the waist and the lower garment extends to her ankles. Her right hand is said to be decipting “warada mudra” (gesture of giving). The raised left hand would have typically held a lotus flower. Such was a small description of this

magnificent figurine of the goddess of kindness.

The serene face of the Thara devi figurine emanates loving kindness. The artisan who crafted the figurine at such a long ago period was successful in striking the compassionate chord in our hearts even today. Gazing at Thara devi figurine’s sublimely beautiful compassionate face, one is reminded of “mettha” (loving kindness) that one should spread to all beings. In contrast, the face of queen nephertiti of Egypt emanates raw power highlighted by the lean features. The fulsome face of venus di milo depicts sensuality.

The statue of incomparable beauty has been with the British museum for over 180 years. There had been recent attempts to get it back. This beautiful piece of Sri Lankan craftsmanship of long gone years belong rightfully with the Sri Lankans. More active efforts to get it back are needed from the authorities.

Sarath Kuruwita

# Father Christmas



Christmas-clipart.net

**Father Christmas** is the name used in many English speaking countries for a symbolic figure associated with Christmas. A similar figure with the same name (in other languages) exists in several other countries, including France (*Père Noël*) Spain (*Papá Noel*), Portugal (*Pai Natal*), Italy (*Babbo Natale*) and Romania (*Moş Crăciun*). In past centuries, the English Father Christmas was also known as **Old Father Christmas**, **Sir Christmas**, and **Lord Christmas**. Father Christmas is said to reside in Lapland Province, Finland, sometimes in the mountains of Korvatunturi.

Father Christmas typified the spirit of good cheer at Christmas, but was neither a gift bringer, nor particularly associated with children. The pre-modern representations of the gift-giver from church history namely *Saint Nicholas*, *Sinterklaas* and folklore, merged with the British character Father Christmas, to create the character known to Americans as *Santa Claus*. Like Santa Claus, Father Christmas has been identified with the old belief in Woden (Odin to the Norse).

In the English-speaking world, the character called "Father Christmas" influenced the development in the United States of Santa Claus, and in the United Kingdom and elsewhere, most people now consider them to be interchangeable. However, although "Father Christmas" and "Santa Claus" have for most practical purposes been merged, historically the characters have different origins and are not identical. Some non-Americans, such as the authors C. S. Lewis and J. R. R. Tolkien, have insisted on the traditional form of Father Christmas in preference to Santa Claus.

**History**

The symbolic personification of Christmas as a merry old figure begins in the early 17th century, in the context of resistance to Puritan criticism of observation of the Christmas feast. He is "old" because of the antiquity of the feast itself, which its defenders saw as a good old Christian custom that should be kept. Allegory was popular at the time, and so "old Christmas" was given a voice to protest his exclusion, along with the form of a rambunctious, jolly old man.

The earliest recorded personification of Christmas appears to be Ben Jonson's creation in *Christmas his Masque* dating from December 1616, in which Christmas appears "attir'd in round Hose, long Stockings, a close Doublet, a high crownd Hat with a Broach, a long thin beard, a Truncheon, little Ruffes, white shoes, his Scarffes, and Garters tyed crosse", and announces "Why Gentlemen, doe you know what you doe? ha! would you ha'kept me out? Christmas, old Christmas?" Later, in a masque by Thomas Nabbes, *The Springs Glorie* produced in 1638, "Christmas" appears as "an old reverend gentleman in furred gown and cap".

The character continued to appear over the next 250 years, appearing as Sir Christmas, Lord Christmas, or Father Christmas, the last becoming the most common. A book dating from the time of the Commonwealth, *The Vindication of CHRISTMAS or, His Twelve Yeares' Observations upon the Times* involved "Old Christmas" advocating a merry, alcoholic Christmas and casting aspersions on the charitable motives of the ruling Puritans.

Father Christmas dates back at least as far as the 17th century in Britain, and pictures of him survive from that era, portraying him as a well-nourished bearded man dressed in a long green fur-lined robe. He typified the spirit of good cheer at Christmas, and was reflected as the "Ghost of Christmas Present" in the Charles Dickens's classic *A Christmas Carol*, a great genial man in a green coat lined with fur, who takes Ebenezer Scrooge through the bustling streets of London on Christmas morning, sprinkling the essence of Christmas onto the happy populace.

Since the Victorian era, Father Christmas has gradually merged with the pre-modern gift giver St Nicholas ( Dutch Sinterklaas, hence Santa Claus) and associated folklore. Nowadays he is often called Santa Claus but also often referred to in Britain as Father Christmas: the two names are synonyms.

Traditionally, Father Christmas comes down the chimney to put presents under the Christmas tree or in children's rooms, in their stockings. Some families leave a glass of sherry or mulled wine, mince pies, biscuits, or chocolate and a carrot for Santa Claus's reindeer near the stocking(s) as a present for him. In modern homes without chimneys he uses alternative 21st century electronic devices to enter the home. In some homes children write Christmas lists (of wished-for presents) and send them up the chimney or post them. Arrangements have been made during the forthcoming postal strikes to give priority to the delivery of mail to Santa Claus.

**Appearance**

Father Christmas often appears as a large man, often around 70 years old. He is dressed in a red or green snowsuit trimmed with white

fur, a matching hat and dark boots. Often he carries a large brown sack filled with toys on his back.

**In fiction**

Father Christmas appears in many English language works of fiction, including C. S. Lewis's *The Lion, the Witch and the Wardrobe* (1950), Raymond Briggs's *Father Christmas* (1973) and the translation from French of Jean de Brunhoff's *Babar and Father Christmas* (originally *Babar et le père Noël*, 1941). J. R. R. Tolkien's *The Father Christmas Letters* are letters he wrote addressed to his children from Father Christmas.

> The *J.R.R. Tolkien Encyclopedia* compares Tolkien's Father Christmas with L. Frank Baum's Santa Claus, as he appears in *The Life and Adventures of Santa Claus*: Santa Claus's friends raise an army to save him from monsters called Awgwas. Tolkien's goblins somewhat resemble the Awgwas, who also steal presents. But Baum's Santa does not fight like Tolkien's Father Christmas does.

C. S. Lewis, a theologian as well as a children's author, prefers the traditional Father Christmas because of his clear connection with the Christian festival of Christmas.

**Names in various countries**

The term "Father Christmas" is used in translation in many countries and languages. "Father Christmas" (and in some cases "baby Jesus") is used in the following countries or languages:

Afghanistan – "Baba Chaghaloo"
Albania – "Babadimri".
Armenia – "Kaghand Papik"
Azerbaijan – "Shakhta baba" (Şaxta baba)
Bosnia and Herzegovina – "Deda Mraz"
Brazil – "Papai Noel")
Canada – Santa Claus, Père Noël
Chile – "Viejito Pascuero"
China – "Shengdan laoren"  Cantonese: Sing Dan Lo Yan, literally "The Old Man of Christmas")
Costa Rica – "Colacho" (from San Nicolás).
Czech Republic –  "Infant-Jesus", is the traditional giftbringer in Czech Republic.
Denmark – "Julemanden"
Ecuador – "Papa Noel"
Egypt – "Baba Noël"
England – "Father Christmas", "Santa Claus"
Finland – Finnish: "Joulupukki",
 Swedish: "Julgubben"
France and French Canada – "Père Noël", "Papa Noël"
Germany – "Weihnachtsmann" (not "Nikolaus", who is celebrated on December 6). Note: The Christkind (Christ-child) is the traditional giftbringer in Southern Germany.
Greece / Cyprus –  Vasílis"
Hungary – "Mikulás" or "Télapó" ("Winter Father")
India – "Santa Claus"
Iran – "Baba Noel"
Iraq – "Baba Noel"
Iceland – "Jólasveinninn"
Indonesia – "Sinterklas"
Ireland – "Daidí na Nollag" (Gaeilge for Father Christmas); Santa Claus or Santy are commonly used in English
Italy – "Babbo Natale" (traditional giftbringers are "Gesù Bambino" (Child Jesus) on Christmas and/or Befana on December 6)
Japan –  (Romaji: "Santakurōsu")

Korea – "santa kullosu"
Latin – "Pater Natalis" or "Sanctus Nicholaus"
Latvia – "Ziemassvētku vecītis"
Lebanon – "Papa Noël"
Lithuania – "Kalėdų Senelis"
Macedonia – "Dedo Mraz"
Mexico – "El Niñito Dios" ("Child God", meaning Jesus)
Mongolia – "Ovliin ovgon" (“ which means Grandfather Winter and is associated mostly with New Year's Eve)
Netherlands and Flanders – "Kerstman" ("Christmas man")
Norway – "Julenissen"
Pakistan – "Christmas Baba"
Peru – "Papá Noel"
Philippines – "Santa Klaus"
Poland – "Święty Mikołaj", "Gwiazdor"
Portugal – "Pai Natal"
Romania – "Moş Gerilă"
Russia – "Ded Moroz" ( which means Grandfather Frost and is associated mostly with New Year's Eve)
Scotland – "Daidaín na Nollaig" (Gaelic); "Father Christmas", "Santa Claus" (English)
Serbia – "Božić Bata" meaning Christmas Boy ( related with Christmas), "Deda Mraz" meaning Grandpa Frost( related with New Year's Eve)
**Sri Lanka – "Naththal Seeya"**
South Africa (Afrikaans) – "Vader Kersfees" or "Kersvader", “Father Christmas” or “Santa Claus”
Spain and some of Spanish-speaking Latin America – "Papá Noel" ("Daddy or Father Christmas") or "San Nicolás" or "Santa Claus". The gift bringers are the Three Kings on 6 January
Sweden – "Jultomten"
Switzerland – "Samichlaus"
Turkey – "Noel Baba" (Note: In Turkey Noel Baba is related with New Year's Eve instead of Christmas.)
Ukraine – "Did Moroz"
United Kingdom – "Father Christmas" and, due the popularity of the term in the United States, "Santa Claus"
United States – Santa Claus
Wales – "Siôn Corn" (Welsh); "Father Christmas" (English)

Source: Wikipedia

Santa Claus riding in his sleigh on the night before Christmas. The sleigh is pulled through the sky by eight reindeer named Dasher, Dancer, Prancer, Vixen, Comet, Cupid, Donner and Blitzen.

www.dititudoran cea.org

**අම්මා**

හිමිදිරියේ නැවුම් බව, රාත්‍රියේ සෞම්‍ය බව, පහන් දැල්ලේ ආලෝකය, හිරු එළියේ උණුසුම,සෙවනැල්ලේ සිසිලස, ගලන දිය දහරක නම්‍යශීලීත්වය, ලේනාගේ දරු සෙනෙහස, සොබාදහමේ චමත්කාරය, පුළුන්වල සුවපහසුව, දිය ඇල්ලක සුන්දරත්වය, උදැසන පින්නේ තෙතමනය, වෙඬරුවල උණුවෙන බව, කළුගල් පර්වතයක ශක්තිය, නිල් මැණිකක කාන්තිය, එකට ගත්කල මතුවන්නේ ඔබෙත් මගෙත් අම්මායි.

සුනිල් රත්නායක

## GRANTS RECEIVED

Special thanks goes to NZ Lotteries Grant Board who granted financial assistance to cover the cost of USLA programms and activities for 2012.

# Changing road rules

The changes to the give-way rules come into effect at 5am on Sunday 25 March 2012. Until then the current give-way rules apply.

These changes will affect all drivers, riders, pedestrians and cyclists in New Zealand.

## Are all the give-way rules at intersections changing?

No. Traffic signs and signals are placed at intersections to show road users what they need to do and this will not change. Road users should continue to obey all road signs and signals.

Here is a snapshot of the current give way rules:

1. If you are at an intersection controlled by a Stop sign, you must stop and give way to all other vehicles.
2. If you are at an intersection controlled by a Give Way sign, you must give way to all other vehicles except those controlled by a Stop sign.
3. If you are turning, give way to all vehicles not turning. Note: If the road is marked with a centre line, you are deemed to be turning if you leave the path of the centre line. If you follow the path of the centre line, you are deemed to be not turning.
4. If you are turning left, give way to vehicles coming towards you that are turning right. (**NOTE:** THIS IS ONE OF THE RULES THAT WILL CHANGE)
5. If the rules above do not determine who gives way, give way to vehicles coming from your right.

## What give-way rules will be changing at 5am on 25 March 2012?

There are two give-way rules that will be changing.

### Change 1: The left-turn versus right-turn rule

From 5am on 25 March 2012, this new rule will require all traffic turning right to give way to a vehicle coming from the opposite direction and turning left. This only applies at cross roads, T-intersections and driveways where:

a) both vehicles are facing each other with no signs or signals (neither vehicle is controlled)
b) both vehicles are facing give way signs
c) both vehicles are facing stop signs
d) both vehicles are facing green traffic signals

### Change 2: At uncontrolled T-intersections ('uncontrolled' means when there are no signs or signals to tell you what to do)

At an uncontrolled T-intersection, all traffic from a **terminating road** (bottom of the T) will have to give way to all traffic on a **continuing road** (top of the T). This will bring it into line with T-intersections where there are Stop or Give Way signs on the terminating road.

This rule change will also apply to uncontrolled driveways, such as at a supermarket or hospital. From 5am on 25 March 2012 the traffic exiting the driveway will need to give way to all traffic on the road.

All vehicles entering or exiting a driveway must continue to give way to pedestrians on a footpath, or cyclists and pedestrians on a cycle path or shared path. Drivers should not pull out to block the footpath in front of pedestrians and cyclists.

## Will there be any changes to the give-way rules at roundabouts?

No. You should continue to give way to vehicles on the roundabout coming from your right.

Further information – www.nzta.govt.nz/travelling around New Zealand

<table>
<tr><td>Independent day celebration<br>04-02-2012<br>8.00am to 2.00pm<br>Mt Eden war memorial hall<br>Dominion Road</td><td rowspan="2">රත්නදීප සඟරාවේ පලකරනු ලබන ලිපි මගින් කිසියම් ආයතනයකට, පුද්ගලයෙකුට හෝ සංවිධානයකට හෝ, පහරගැසීමට හෝ සිත රිදවීමට බලාපොරොත්තු නොවන අතර එසේ වුයේ නම්, ඒ ගැන කණගාටුවන අතර එයට සමාව දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.<br><br>රත්නදීප සංස්කාරක</td></tr>
<tr><td>Annual general meeting<br>18-02-2012<br>Mt Albert senior citizen hall</td></tr>
</table>


With Compliments

SKYtravel

Contact
Virendra Bahshi
(Manager)
021 172 4770

1C Hayr Road, Three Kings
Auckland 1042 DX CP39008
Phone: 09 624 5210
Fax: 09 624 5211
Email: viru@skytravel.co.nz